

# අබිරහස් වනාන්තරයේ දියමන්ති සොරකම

L.A. ගෝතමී උත්තරා මෙත්කලනි

# අබිරහස් වනාන්තරයේ දියමන්ති සොරකම

# අබිරහස් වනාන්තරයේ දියමන්ති සොරකම

L.A. ගෝතමී උත්තරා මෙත්කලනි
කතෘ

පළමු දිගහැරීම

මහමායා බාලිකා විද්‍යාලය
6 වසර C
2026.06.08

978-624-211-382-1

# පිදුම

සිප් කිරි පොවා නැණ
ගුණ දහමින් පෝෂිත
රටට දැයට
වැඩ ඇති
පින්වන්ත දියණියන්
තනන්නට
දිරිය දෙන මාපිය
ගුරුවරුන්ට පුදමි
හදපිරි
බැතියෙන්.

# පෙරවදන



**පෙරවදන**

දිනෙන් දින සංකීර්ණ වන ගෝලීය අනාගත ලෝකයට දියණියන් සූදානම් කරණ බාලිකා අධ්‍යාපනයේ හැරවුම් ලක්ෂයක් ලෙස මහාමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් සිදුකරණ හේමමාලා උපහාර ගත්කරණ ව්‍යාපෘතිය නම්කළ හැකිය. දශකයක තරම් කාලයක් දහස් ගණනක් දැයේ දරුවන් ගත්කතුවරුන් ලෙස  දැයට දායාද කරන්නට හැකිවීම පාසලක් වශයෙන් ලබන විශිෂ්ට ජයග්‍රහණයකි.  මෙවරද වෙනත් පාසල් හා එක්ව පාසල් දරුවන්ට නව අත්දැකීම් සමුදායක් සන්නිවේදන නිපුණතා සාරධර්ම මෙන්ම නිර්මාණාත්මක ප්‍රවර්ධනය වැනි බහුවිධ කුසලතා සංවර්ධනය අරමුණු කොටගෙන පොත් ලියන්නට යොමුකරන ලදි. එහි ප්‍රතිඵලයක් ලෙස ලියැවී ඇති ළමා ග්‍රන්ථ තුළින් ලෝක බෞද්ධ ජනතාවගේ පූජනීය සංකේතය කන්ද උඩරටට අගයක් එකතු කළ ශ්‍රී දළදා වහන්සේ වැඩමකර වූ හේමමාලා කුමරියට උපහාර දැක්වීම මෙවර අපගේ මූලික අරමුණයි.  මේ සඳහා නිර්මානකරණයෙන් දායක වූ පාසල් දරුවන් මගපෙන්වූ ගුරුභවතුන් ඇතුලු සැමට ස්තුතිය පුදකරමු.

ශශිකලා සේනාධීර

විදුහල්පතිනිය

මහාමායා බාලිකා විද්‍යාලය

# සුභාශිංසන පණිවුඩය

මහනුවර මහාමාය බාලිකා විද්‍යාලය ආරම්භ කර ඇති හේමමාලා උපහාර ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය තුළින් නිර්මාණය වූ ග්‍රන්ථ එළි දැක්වීම වෙනුවෙන් මධ්‍යම පළාත් ගරු ආණ්ඩුකාරවර වශයෙන් සුභාශිංසන පණිවිඩයක් එක් කිරීමට ලැබීම මා ලැබූ භාග්‍යයක් කොට සළකමි.

අධ්‍යාපනය යනු සමාජයේ ප්‍රගතියට මූලික පදනම වන අතර, එය පොත්පත් හා සාහිත්‍ය නිර්මාණ හරහා තවදුරටත් ශක්තිමත් වේ. සිසු දරුවන්ගේ දක්ෂතා, නිර්මාණශීලීත්වය සහ බුද්ධිමය හැකියාවන් මෙවැනි ව්‍යාපෘති මඟින් මතුවීම ඉතා ප්‍රශංසනීය බව පැහැදිලිය.

මෙම ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය තුළින් සිසු දරුවන්ට පමණක් නොව, සමස්ත සමාජයටම වටිනා දැනුමක් සහ අගනා සාහිත්‍ය දායාදයක් ලබාදෙනු ඇති බව මම විශ්වාස කරමි. එමෙන්ම, මෙවැනි උත්සාහයන් තුළින් අනාගතයේ ශ්‍රී ලංකාවට අභිමානයක් වන ලේඛිකාවන් බිහිවනු ඇතැයි බලාපොරොත්තු වෙමි.

මෙම සාර්ථක කටයුත්ත සඳහා කැපවූ විදුහල්පතිතුමිය, ගුරු මණ්ඩලය, සිසු දරුවන් සහ සම්බන්ධ වූ සියලු දෙනාට මාගේ හෘදයාංගම ප්‍රශංසාව සහ ආශිර්වාදය පිරිනමමි. මෙම ව්‍යාපෘතිය සහ ග්‍රන්ථ එළි දැක්වීමේ උත්සවය විශිෂ්ට සාර්ථකත්වයක් ලබනු ඇතැයි ප්‍රාර්ථනා කරමි.

සරත් බී.එස්. අබයකෝන්,
ආණ්ඩුකාරවර,මධ්‍යම පළාත.
සම්මානිත මහාචාර්ය , පේරාදෙණිය විශ්වවිද්‍යාලය.
2026-05-10

# සුභාශිංසන පණිවුඩය


වත්මන් පාසල් පද්ධතිය තුළ දූ දරුවන් ග්‍රන්ථකරණයට යොමු කිරීමේ අරමුණින් මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් මහනුවර කලාපයේ සෙසු පාසල්වල සහභාගිත්වයෙන් මෙවර පරම පූජනීය ශ්‍රී දළදා වහන්සේ ලක්දිවට වැඩමකළ හේමමාලා කුමරියට උපහාර පිණිස ග්‍රන්ථ එළි දැක්වීමේ ව්‍යාපෘතියක් සංවිධානය කළ මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පති තුමිය ඇතුළු ආචාර්ය මණ්ඩලය, ශිෂ්‍ය දියණිවරුන්, සෙසු පාසල්වල ශිෂ්‍ය දූ පුතුන් සහ මෙම ව්‍යාපෘතිය සැලසුම්කර ක්‍රියාවට නැංවීමට කැපවූ සියලු  දෙනාගේ විශිෂ්ට වූ උතුම් ප්‍රයත්නය අතිශයින් අගය කරමි.

ශ්‍රී ලංකාව දශක කිහිපයක් තිස්සේ සියලු දරුවන්ට නිදහස්, අනිවාර්ය, ගුණාත්මක හා සාධාරණ අධ්‍යාපනයක් ලබා දීමටත් එමඟින් අනාගතයේදී බුද්ධිමත් කුසලතා පූර්ණ පුරවැසි පරපුරක් බිහි කිරීමටත් කැපවී සිටී. එවන් පසුබිමක සුසමාහිත වූ සමබර පෞරුෂයක් සඳහා නිර්මාණ හැකියාව, විචාරශීලී චින්තනය ඇතුළු ධනාත්මක අංග ලක්ෂණ සංවර්ධනය වී අනාගත දැනුම් පාදක සමාජයක් නිර්මාණය කිරීමට පාසල් දරුවන්ගේ මෙම ග්‍රන්ථකරණ වැඩසටහන හේතු පාදක වේ. ශ්‍රී දළදා සමිඳු සරණින් හේමමාලා උපහාර ග්‍රන්ථකරණ ව්‍යාපෘතියේ සියලු කටයුතු සාර්ථක වේවායි මම ප්‍රාර්ථනා කරමි.

ප්‍රදීප් නිලංග දැල,
දියවඩන නිලමේ,
ශ්‍රී දළදා මාලිගාව
2026.05.10

# 01. ෂෙර්ඩි ගම

ෂෙර්ඩි ගමේ මිනිස්සු ටික
දෙනෙක් තමයි ඉන්නේ. ගෙවල්
විසිපහක්, මිනිසුන් සියයක්
වගේ තමයි ඉන්නේ. ෂෙර්ඩි
ගමට මේ නම ලැබුණේ ගම
වටේම තියෙන රතුම රතු
පාටින් අතු බර වෙලා තියෙන
චෙරි ගස් නිසා. මේ චෙරි ගස්
නිකම් ගම ආරක්ෂා කරන
වැටක් වගේ. මොකද කීවොත්
චෙරි ගස් පේළියෙන් එහාට
යද්දී තියෙන්නේ කැලෑව නිසා.



# 02. අබිරහස් කැලය පිළිබද දැන ගැනීම.

මේ ගමේ හිටියා
"ගඟන හා ගඟනි" කියා නිවුන්
ළමයි දෙන්නෙක්. මෙයාලගෙන්
වැඩිමලා ගඟනි . මේ
දෙන්නගේ සීයා හැම
වේලාවෙම කියන්නේ චෙරි ගස්
පේළියට එහා පැත්තෙන්
තියෙන "අබිරහස් කැලෑව"
ගැනයි. මේ දෙන්නට ඒ
කැලෑව ගැන දැනගන්න
හිතිලා ගඟනි සීයාගෙන්
මෙහෙම ඇහුවා. "සියේ, සීයා
හැම වෙලේම අබිරහස්
කැලෑවක් ගැන කියනවා.
මොකද්ද ඒ කතාව සියේ.
මටයි මල්ලිටයි ඒ කතාව
කියලා දෙන්නකෝ."

"ඒක දිග කතාවක්.. ඔන්න
එහෙනම් හොඳට
අහගන්නකෝ." සීයා එහෙම
කීවා. ළමයි සීයා දෙස මහත්
ඕනෑකමින් බලා සිටියා. "ඔය
කැලෑවට අබිරහස් කැලෑව
කියලා කියන්නේ ඒ කැලෑවේ
අබිරහස් විශාල ප්‍රමාණයක්
ගැබ් වෙලා තියෙන නිසා.
ඔය කැලෑවේ මැද හරියේ
තියන විශාල ගසක
තියෙනවා ලොකු රතු
දියමන්තියක්, ඒක ගන්න
ගොඩ දෙනෙක් ගියත්
කවුරුත් ආයේ පණ පිටින්
ආවේ නෑලු. ඒ නිසා දැන්
කවුරුත් ඒ පැත්තට යන්න
බයයි.

ඒකට මුල් වන හේතුව තමයි ඒ රතු දියමන්තිය ආරක්ෂා කරන්නේ හරිම විස සහිත නාගයෙක්" සීයා කිවුවා. ළමයි තුළ බයක්, ඇති වුවත් එය කෙමෙන් කෙමෙන් කාලය යන විට පහව ගියේ ය.

## 03. කුතුහලය

ළමයින්ගේ සිත තුළ බයක් ඇති වුවත් සිත තුළ එම කතාව රැවු පිලි රැවු දෙමින් මොවුන්ගේ සිත් තුලට කා වැදිණි. එම නිසා මොවුන්ගේ කුතුහලය කෙමෙන් කෙමෙන් සිත් තුළ වැඩි විය.



ළමයින් දෙදෙනාගේ සිත් තුළ
කුතුහලය එන්න එන්නම වැඩි
විය. ඒ නිසා සෑම දිනකම චෙරි
ගස් පේළිය ළඟට ගොස් ආපසු
පැමිණීම ඔවුන්ගේ සිරිත විය.

# 04.රතු දියමන්තිය සෙවීමට අදහසක් පැන නැගීම.

එක් දිනක් ගඟුනි,ගඟුනට මෙහෙම කීවා "අපි රහසේම අබිරහස් කැලෑවට ගිහින් ඒ රතු දියමන්තිය අරගෙන ඇවිත් අපේ ගමේ මිනිසුන්ට උදව් කරමු." පසුව මල්ලි මෙසේ කීවා. "එපා, මට නම් බෑ. සීයා කීවා මතක නැද්ද රතු දියමන්තිය ගන්න ගියපු කවුරුත් ආයේ පණ පිටින් ආවේ නෑ කියලා. ඒ නිසා මටනම් බයයි. මම එන්නේ නෑ" " ඒ නරක මිනිස්සු වෙන්න ඇතිනේ. අපි හොඳ මිනිස්සුනේ. ඒ නිසා ඒ රතු දියමන්තිය ආරක්ෂා කරන නාගයාගෙන් අපට කරදරයක් නැති වේවි." අක්කා නැවත නැවතත් කියමින් මල්ලීව කැමති කරවා ගත්තා.

# 5.ගමන් ආරම්භ කිරීම

ගඟනි හා ගඟන ගමන ආරම්භ කළා. එයාලා චෙරි ගස් පේළිය ළඟට ඇවිත් එතන ඉඳන් හෙමින් හෙමින් අබිරහස් වනයට ගමන් කළා. රතු දියමන්තිය ආරක්ෂා කරන නාගයා දැක්කා මේ ළමයි දෙන්නා එන්නේ රතු දියමන්තිය හොරකම් කරන්න කියලා.
"හොඳයි වගේ පෙනුනට මෙයාලා නරක අයද දන්නේ නැණේ. මෙයාලාව පරික්ෂා කරල බැලුවනම් හරි.. කලින් මිනිස්සු වගේ පුංචි ළමයි දෙන්නත් නරක අය වුනොත්
මේ ළමයිනුත් මගේ බඩේ තමා."
නාගයා එහෙම හිතුවා.

පරීක්ෂණයක් ලෙස නාගයා පළමු වර වලහකුගේ ස්වරූපයක් මවාගෙන ඊතල පහර කා තුවාල වී ලේ ගලන ලෙස ළමයින් පැමිණෙන මාවත අසල වැටී සිටියේය. ගඟනි හා ගඟන මෙය දැක ගඟන මෙහෙම කීවා. "අපි මේ සතාට බෙහෙත් දාලා උදවු කරමු" "ඒක නම් හොඳ අදහස... ඇයි අපේ ගුරුතුමී කියලා දුන්නානේ සතෙකුට කරදරයක් උනාම උදව් කරන්න කියලා." ගඟනිත් කීවා. දෙදෙනාම එකතු වී වලසාට බෙහෙත් දැම්මා.



එක් වරම ඒ වලහා කැලය තුලට
දිව ගොස් නොපෙනී ගියා."මේ
වතාවේ හොඳ මූණ පෙන්නුවාට
ඊළඟ වතාවේ මොනව වෙයිද
දන්නේ නෑනේ.. තව පාරක් උත්සහ
කරලා බලමුකෝ." නාගයා සිතුවා.
නාගයා නැවතත් ගිරවෙකුගේ
වේශයෙන් ගඟුන හා ගඟුනි ඉන්නා
තැනට ඉගිලි ආවා. ගඟුන අසල තිබූ
පේර ගසෙන් පේර ගෙඩි දෙකක්
කඩා එකක් ගඟුනිට දී අනෙක් පේර
ගෙඩිය ගඟුන ගත්තා. දෙදෙනාම
පේර කමින් යන විට අර ගිරවා
අසලට පැමිණ බැගෑපත් ලෙස
කෑගැසුවේය. ගඟුනි තමා අතේ
තිබුණු පේර ගෙඩියෙන් කෑල්ලක්
ගිරවාට දුන්නා. ගිරවා පියාඹා
නැවත අතුරුදහන් විය."දෙවන
වරටත් හොඳ වූවාට තුන්වනවරට
නරක විය හැක. අවසන් වරටද
උත්සහයක් දරමු" නාගයා සිතුහ.

# 6 ළමුන් ව සෙවීම හා තෙවන පරීක්ෂණය.

ගමේ මිනිස්සු හරි බයෙන්, දුකෙන්. මොකද ගමේ හිටපු ගඟනයි ගඟනියි නෑනේ. එයාලත් හැම තැනම යනවා, හොයනවා. සමහරු කියනවා ළමයින්ව හොඳට පරිස්සම් කරගන්නේ නෑ කියලා. ඒ කොහොම කොහොම හරි දැන් රතු දියමන්තිය ආරක්ෂා කරන නාගයා තුන්වන වරට ගියේ නාග වේශයෙන්මයි. නාගයා ගඟනි හා ගඟන ඉදිරිපිට ගොදුරක් ලෙස අහිංසක භාවෙක්ව ගිලින වේශයෙන් පෙනී සිටියේය. ගඟනි ඒ අහිංසක භාවාව බේරා ගැනීමට ගියාය. එවිට ගඟන අක්කා නයා ගාවට යන්න එපා කීවා.

එවිට ගඟුනි "බෑ.. එතකොට මේ අහිංසක හා පැටියා පව් " කීවා. "එහෙනම් මමත් උදව් කරන්නම්" යැයි ගඟුන කීවා. පසුව ගඟුනත් ගඟුනිත් ඒ අහිංසක හාවාව බේර ගත්තා. එවිට නාගයා බිම දිගේ බඩගා කැලයට ගොස් අතුරුදහන් විය.

## 7 රතු දියමන්තිය සොයා ගැනීම.

දැන් නාගයා හිතුවා "මෙයාලා හොඳ කට්ටියක් වගේ. මම කොච්චර දේවල් කරත් වැඩක් නෑනේ. ඒ නිසා මම පරීක්ෂා කිරීම් නවත්වනවා. මෙයාලගේ අදහස රතු දියමන්තිය රැගෙන ගමේ මිනිස්සුන්ට උදව් කිරීමනේ.

ඒ නිසා මෙයාලට රතු
දියමන්තිය ගන්න දෙමු.” නාගයා
සිතුවේය. දැන් ළමයි ගස්වල
තියන හැම බෙනයකම බලනවා
රතු දියමන්තිය තියනවද කියලා.
ගඟන බැලූ එක ගසක බෙනයක
රතු දියමන්තිය දිලිසි දිලිසි
තිබෙනු දුටුපසු එක්වරම කෑගසා
අක්කාට මෙසේ කීවේය.
"අක්කේ!!! අක්කේ!!! මෙහෙට
එන්නකෝ. මට රතු දියමන්තිය
හම්බ වුණා.” මල්ලී කෑගසමින්
කීය.



අක්කා විගස ඒ අසලට
පැමිණියාය. එය දුටු අක්කා
සතුටින් ඉපිල ගියාය. අක්කා හා
මල්ලි එකිනෙකා වැළඳගනිමින්
සතුටුවෙමින් රතු දියමන්තිය
අතට ගෙන එහි අලංකාරය,
සුන්දරත්වය,
චමත්කාරජනක බව දෙස කෙටි
වේලාවක් බලා සිටියහ. පසුව
රතු දියමන්තිය ගෙන ගඟුන හා
ගඟුනි විශාල ගස දෙස බලා
සිටියහ. රතු දියමන්තිය ආරක්ෂා
කළ නාගයා ඉදිරිපිට පෙනී සිට
ගඟුනට හා ගඟුනිට මෙසේ කීය.
"ඔබ ඉතා හොඳ සිත් ඇති අය.
ඔබව පරීක්ෂා කිරීම සඳහා
තුවාල වී සිටි වලසා, බඩගින්නේ
සිටි ගිරවා හා අහිංසක හාවෙක්
ගොදුරු කරගෙන සිටි නාගයෙක්
ලෙසින් වේශය මාරුකරමින්


පැමිණියේ මම, ඔබ ඒ අභියෝග
සියල්ල මැඩගෙන රතු
දියමන්තිය අතට ගත්තා.මම
ඔබට සතුට එක් කරමි.
එපමණක් නොව මම ඔබට රනින්
පිරවූ රත්තරන් පෙට්ටියක්ද ලබා
දෙමි." කියූ නාගයා ඔවුන්ට
රත්තරන් පෙට්ටියක්ද තෑගි
කළේය.

## 8. දෙමව්පියන් හමුවීම.

ළමුන් වෙරි ගස් පේළිය ළග සිට
ගම තුලට එනු දුටු මිනිසුන්
ළමුන් දෙදෙනා වටා එක්රොක් වී
ඔවුන්ගේ හපන්කම්, රතු
දියමන්තිය ලබා ගැනීමට යාමේදී
ඇති වූ අභියෝග හා රතු
දියමන්තිය ලබා ගත් ආකාරය
පිළිබඳ දැන ගත්හ.

ඉන්පසු ගඟන හා ගඟනි
රත්තරන් සෑම දෙනාටම ආධාර
පිණිස බෙදා දී රතු දියමන්තිය
ගමේ දියුණුව උදෙසා
යෙදවූහ.එමෙන්ම නැති වූ ගඟන
හා ගඟනි නැවත හමුවීම පිළිබඳ
ව ගම්වැසියන් සතුටට පත් විය.

නිමි.





# පසුවදන

අධ්‍යාපන අමාත්‍යංශ අනුමැතියෙන් දශකයකට වැඩි කාලයක් පාසල් දරුවන් දහස් ගණනක් ගත්කතුවරුන් දැයට දායාද කළ මෙම ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය පාසල් අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනයට බෙහෙවින්ම උපකාරී වු වැඩසටහනක් බව අධ්‍යාපනඥයින්ගේ පිළිගැනීමයි. නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ වලට සමගාමීව මෙවර පාසල් දරුවන් පර්යේෂණ කෘතියක් රචනා කරන්නට යොමුකර වීම ව්‍යාපෘති ගමන්මගේ හැරවුම් ලක්ෂයකි. ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් ඇල්ෆා පරම් පරාවකට අනාගත ලෝකය පෙන්වාදෙන නූතන පාසල නූතන තාක්ෂණික මෙවලම් මෙන්ම පොතපත ද සමව පරිහරණය කළයුතුබව පර්යේෂණාත්මකව පෙන්වා දෙන්නේ පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන්කිසිවකින් වත් ලබාදිය නොහැකි නිසාය.

තවමත් අප අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලම මෙන්ම මානව දැනුම ගබඩා වී ඇති පොතපතින් දරුවන් දුරස් වීම වළක්වාගන්නට මෙන්ම අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනය වෙනුවෙන් වසර ගණනාවක සිට මෙම ව්‍යාපෘතියට උරදී සිටින මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් **“හේමමාලා උපහාර”** ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය දියත්වෙයි. පාසල් දරුවන් තුළ ශාස්ත්‍රීය හික්මීම මෙන්ම සාරධර්ම නිපුණතා ප්‍රවර්ධනයත් යුගයේ අවශ්‍යතාවයක් වන කාන්තාව සවිබළ ගැන්වීමට ඉතිහාසයේ යුගමෙහෙවරක් ඉටුකළ හේමමාලා කුමරියට උපහාර දැක්වීම ද මෙහි මූලික අරමුණයි.
මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ දියණියන්, විදුහල්පතිනිය, ගුරුභවතුන්, දෙමාපියන්, ආදි ශිෂ්‍යාවන් සහ සෙසු පාසල් නියෝජනය කරන සියලු දෙනාටද, දියවඩන නිලම තුමන් ඇතුලු ශ්‍රී දළදා මාලිගාවේ කාර්ය මණ්ඩලයටද මෙම සද්කාර්ය වෙනුවෙන් ස්තුති වන්ත වෙමු.

සෙනෙවිරත්න මහලේකම්
( ව්‍යාපෘති නිර්මාතෘ)

978-624-211-382-1